දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

# ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2013 පරීක්ෂණය - 2016 සැප්තැම්බර්
# Bachelor of Arts General (External) Degree Part I 2013 Examination - September 2016

## සවිසා 2.2 - සමාජ විද්‍යාත්මක ක්‍රම
## SGYG 2.2 - Sociological Methods

**කාලය පැය තුන යි**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. "පර්යේෂණයක් යනු විද්‍යාත්මක ක්‍රමය භාවිතා කරමින් කිසියම් සුවිශේෂ පර්යේෂණ ගැටළුවක් පිළිබඳව සුපරීක්ෂාකාරීව සිදුකරනු ලබන ක්‍රමවත් අධ්‍යයනයකි." විමසන්න.

02. විද්‍යාත්මක පර්යේෂණයකදී භාවිතා වන දත්ත පිළිබඳ වර්ගීකරණයක් සිදුකර පර්යේෂණ අනුව, රැස්කරනු ලබන එම දත්තවල ස්වරූපයන් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

03. පර්යේෂණ සැලැස්මක් යනු කුමක් ද? යම් පර්යේෂණයකට අදාලව සුදුසු පර්යේෂණ සැලැස්මක් තෝරාගැනීමේ දී සලකා බලනු ලබන සාධක මොනවාදැයි පෙන්වා දෙන්න.

04. සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් සඳහා සමීක්ෂණ සැලැස්මක් යොදා ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රමවත් අදියරයන් මොනවාද යන්න පැහැදිලි කරන්න.

05. ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්ම නිර්වචනය කර, සමාජ විද්‍යාත්මක පර්යේෂණයක දී එම සැලැස්ම භාවිත කිරීමේ ප්‍රයෝජන හා සීමාවන් පරීක්ෂා කරන්න.

06. නියැදීම යනු කුමක් ද? ඔබ කැමති ඕනෑම නියැදීම් ක්‍රම දෙකක් ගෙන ඒවායෙහි භාවිතාවන ක්‍රමවේදය හා ප්‍රයෝජන පිළිබඳව සැසඳීමක් කරන්න.

07. පර්යේෂණ වාර්තාවක ක්‍රමවත්ව අඩංගු විය යුතු අන්තර්ගතයන් මොනවා ද යන්න පැහැදිලි කරන්න.

08. පහත දැක්වෙන මාතෘකාවන්ගෙන් ඕනෑම දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න.
    - අ. අත්හදා බැලීමේ සැලැස්ම
    - ආ. උපන්‍යාස
    - ඇ. පර්යේෂණ යෝජනාවලිය
    - ඈ. සහභාගී නිරීක්ෂණය